# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2117/2 – 2019 අප්‍රේල් 01 වැනි සඳුදා – 2019.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2013 අප්‍රේල් මස 26 වැනි දින අංක 1807/22 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 112 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත I වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/97.<br>
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය: WGSWD&EIP/ACQ/KB/12<br>
2019 මාර්තු මස 27 වැනි දින,<br>
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,<br>
මිහිකත මැදුර,<br>
අංක 1200/6,<br>
රජමල්වත්ත පාර,<br>
බත්තරමුල්ල.

I වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535A, බෙල්ලන්විල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බොරලැස්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො. 9466 හා 2016.02.11 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 09 – ඉඩමේ නම සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0825**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 42 සහ අංකය සොයාගත නොහැකි ඉඩම; නැගෙනහිරට: අංකය සොයාගත නොහැකි ඉඩම, මාලනී බුලත්සිංහල මාවතේ හිමිකම් කියන අය සොයාගත නොහැකි සහ අංක 22/3, මාලනී බුලත්සිංහල මාවතේ මාස් මේධාවිනී අයේෂා කනකා හිමිකම් කියන ඉඩම; දකුණට: මෙම පිඹුරේ කැබලි අංක 10 සහ අංක 26/2 මාලනී බුලත්සිංහල මාවත; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 42.

04 - 484